


# අවුරුදු උත්සවය

සෙන්ට්ඕල්බන්ස් සිංහල භාෂා පාසල

**මහින්ද දිසානායක දිවුල්ගනේ**

ලොව කොයි දේශයක අප ජීවත් වුවද අප ඉපදුන, හැදුණ, වැඩුණ වේ අපේ අප්‍රේල් නිවාඩුව ගත කළත් පදිංචි වී සිටියද කෙදිනකවත් අප්‍රේල් මාසය, බක් මාසය අපේ ශ්‍රී ලාංකික හදවත් තුලින් කිසිදා මැකී නොයන්නේ ඒ තරමටම ශ්‍රී ලාංකීය සංස්කෘතිය අපේ හදවත් තුළ මසදා කල් කිඳ බැස ඇට, මස්, ඇට මිදුලු දක්වාම විහිදී ගොස් ඇති බැවිනි. එරබදු මල්, කොහා, රබන් සුරල්, ඔන්චිලි වාරම් වැනි සුන්දර වචන අප්‍රේල් මාසයේදී අපි අහන්න බලාගෙන ඉන්නේ. අවුරුද්දත් ගෙවිලා ගිහිල්ලා තවත බක් මහ අසිරිය විඳ ගත හැකි දිනයක් එනතුරු ශ්‍රී ලාංකිකයෝ මග බලාගෙන ඉන්නේ.

බටහිර වික්ටෝරියා ශ්‍රී ලංකා බෞද්ධ සංගමය 2018 වසරේදීත් අවුරුදු උත්සවය (අවුරුදු උදානය) පැවැත්වීමට කටයුතු සංවිධානය කොට තිබෙනවා. සුපුරුදු පරිදි ගිය වසරේ ලෙසට මෙවරද ඉතා උත්කර්ෂවත් ලෙස මෙම අවුරුදු සැනකෙලිය පැවැත්වීමට කටයුතු සංවිධානය කොට තිබේ. උදේ 9.00 සිට සවස් වනතුරු ඔබේ පවුලේ අයට මෙම අවුරුදු උත්සවයට සහභාගී වනවා පමණක් නොව පවුලේ සැමට එකට විනෝද විය හැකිය.

පුංචි දරුවන්ගේ සිට තරුණ වැඩිමහල් සැමට සහභාගිවිය හැකි තරග සංවිධානය කොට තිබීම විශේෂයකි. බටහිර වික්ටෝරියා බෞද්ධ සංමගමය පමණක් නොව විශේෂයෙන් අප සෙන්ට්ඕල්බන්ස් සිංහල භාෂා පාසල ගුරුවරුන් එහි දෙමාපියන්, දරුවන් මෙන්ම අප විහාරස්ථානයේ සම්බන්ධිත දායක පිරිස, ප්‍රදේශවාසීන්ගේ සහභාගීත්වයෙන් සහයෝගයෙන් මෙම විශාල වූ ව්‍යාපෘතිය සංවිධානය වීම විශේෂයක්.

ඔබ සැමදොනාට පමණක් නොව පවිලේ සැමට විශේෂයෙන් දෙමාපිය දූදරුවන්ට එකතුවී රස විඳිය හැකි විනෝද විය හැකි ඒ විතරක් නොවෙයි ඔබේ යහළු යෙහළියන්ට අසල් වාසීන්ට ද ඔබ හා එකතු වී සතුටු විය හැකි අවුරුද්දක් ලැබෙන අවස්ථාවක්. ආයෙත් ඔබට මෙවන් සැනකෙළියකට සම්බන්ධ වෙන්නට තවත් අවුරුද්දක් ලැබෙන තුරු බලාගෙන සිටිය යුතු වේ. කාලෙකින් ඔබට මුණ ගැසෙන ඔබේ යහළු යෙහළියන් සමඟ කතා බස් කරන්නට අවුරුදු අසිරිය විඳින්නට හොඳම වෙන්නේ ඔබේම පළාතේ රොක් බෑන්ක් පාරමිතා විහා රස්ථානයේ සම්බන්ධතාවය විහාරාධිපති ගරු ශාස්ත්‍රපති පල්ලේවෙල දේවරක්ඛිත හාමුදුරුවන් වහන්සේගේ හා විහාරස්ථානයේ වැඩ සිටින ගරු හාමුදුරු-වන් වහන්සේලාගේ අනුශාසනය පරිදි මේ සංස්කෘතික උත්සවය සංවිධානය වී ඇති බැවිනි.

මෙවරද මෙම සංස්කෘතික මංගලයය පැවැත්වෙන්නේ ඈැර ඡ්රන සසෙල්ලා පා-ක්හිදී බැවින් වාහන නවතා තැබීමේ පහ-සුවද ඒ වගේම ඉතා සුන්දර ස්ථානයක් හා ඔබේද ප්‍රදේශයේ පිහිටි දුර බැහැර නොවූ අපූරු තැනක් ඔබට ඉතා ආසන්න ප්‍රදේශයේ පිහිටි පහසුවෙන් ලඟාවිය හැකි ස්ථානයක් ඒ විතරක් නොවෙයි ගියවර මෙන් මෙවරද පහසු මිලට ගත හැකි ආහාර පාන විශේෂයෙන් ශ්‍රී ලාංකිය රසවත් ආහාර පාන මෙම ස්ථානයේදී මිලදී ගත හැකි අතර ඔබ සැමට එක්ව ඒ ආහාර පාන භුක්ති විඳීමට හැකිය.

මෙම සංස්කෘතික උත්සවය එනම් අපේ අවුරුදු උදානය මෙවන් අයුරින් සංවිධානය කිරීමේදී ගෞවරණීය මග පෙන්වීම ගරු විහාරාධිපති හාමුදුරුවන් වහන්සේගේ හා බටහිර වික්ටෝරියා ශ්‍රී ලංකා බෞද්ධ සංගමයේ ගරු සභාපතිතුමාගේ (..... පෙරේරා) හා සියළු සංගමයේ සැමගේ මෙන්ම සිංහල භාෂා පාසලේ ප්‍රධාන සංවිධායක චන්ද්‍රසිරි වීරසිංහ මහතා බණ්ඩ-ාරනායක විදුහලේ සංවිධායක මණ්ඩලයේ සැමගේද සම්බන්ධතාවය හා කැපවීම මෙහිදී සඳහන් කළයුතුම වූ කරුණක් වේ.

මෙවැනි කැපකිරීම තුලින් මෙවන් සංස්කෘතික උත්සවයක් අවුරුදු පතා පැවැත්වීමේ ප්‍රධාන අරුමුණ වන්නේ හෙට දවසේ අපගේ දුවා දරුවන්ට අපේ උරුමයත් සංස්කෘතිය උසස් චාරිත්‍රවාරිත්‍ර පිළිබඳව කියා දීමත් ඒවා ආරක්ෂා කිරීමේත් උසස් වූ පරමාර්ථය නිසාමය. ඕනෑම ජාතියක පැවැත්ම පවතින්නේ එහි අනන්‍යතාවයත් සංස්කෘතිය හා චාරිත්‍රවාරිත්‍ර යානාදිය ආරක්ෂා වනතුරුය. මේවා ආර-ක්ෂා වනවා පමණක් නොව ඒ තුලින් සදාචා රාත්මක සමාජයක් වට පිටාවත් දුවාදරුවන් අපට උරුම කරගත හැකි වේ.

තවත් සිහිපත් කළයුතු කරුණක් නම් පුංචි දරුවන් තරුණ දරුවන් හා වැඩිහිටියන් වෙනුවෙන් සංවිධානය වූ තරග සඳහා ඉදිරිපත් වීම විශේෂයෙන් වැදගත් වේ. මේ නිසා ඉදිරිපත් වීමේ වටිනාකමත් ජය ගත් පසු පරාජයට පත් වූ විට එකසේ ජය පරාජය භුක්ති විඳීමේ ශක්තියත් ඔබට නිසැකවම ලැබේ. ඒ තුලින් ඔබට විනෙ-ාදයක් මිස කළකිරීමක් ඇතිවීම තරගයක පරමාර්තය නොවේ. ඒ කුසලතාවද මෙහි විශේෂයකි. ජීවිතය යනු දිනීමේ හා පරා-ජයේ සතුට දුක එකසේ දරා ජීවිතයට මුහුණ දීමයි. සැබෑ මිනිසකු බිහිවන්නේ ද ඒ ධර්මය තුලින් බව අප අමතක කළ යුතු නොවේ.

2018 සිංහල අළුත් අවුරුදු උත්සවය අප්‍රේල් මස 01 වන ඉරිදා උදේ 9.00 සිට සවස 5.00 වනතුරු DEER PARK SASSELLA PARK 119 STATION RD හිදී පැවැත්වීමට කටයුතු සංවිධානය කොට තිබේ. බටහිර වික්ටෝරියා බෞද්ධ සංගමය හා අප සිංහල භාෂා පාසල ප්‍රදේශවාසී ඔබ සැමට, දූදරුවන්, අසල්වාසීන්, හිතවතුන් සමඟ එදිනට සහභාගී වීමට ගෞරවයෙන් හා ආදරයෙන් ආරාධනය කර සිටී.

විමසීම් :-
චන්ද්‍රසිරි වීරසිංහ - 0402310091
බණ්ඩාරනායක - 0425855621

**Office/Shop Space for Sale**

in Ja-Ela (Orex City)

================================

Orex city shopping complex shop
no 333 [2nd floor of Cargills Building]
Office/Shop space for sale

**ජා ඇල ඒකල**

Orex City Shopping Complex.
No .333.

**කඩ කාමරය විකිණීමට**

**ව්‍යාපාරික හෝ කාර්යාලයක් ලෙස**

**ජල විදුලිය** Attached Toilet
**ව්‍යාපාරික ස්ථානය ටයිල් කර ඇත**
**ඉදිරිපස ටෙම්පර්ඩ් ග්ලාසස්**
**වර්ග අඩි 189**
**විදුලි සෝපාන**
**රථගාල පහසුකම**

Price: 16500 AUD
Contact Telephone: +61438038624

සන්නස
බලන්නට ඇති පත්තර අතර
කියවන්නට ඇති පත්තරයක්